සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 8 | විෂයය / பாடம் / Subject: බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02 |

නම :- ......................................................................................... විභාග අංකය :- ...........................

සැලකිය යුතුයි:

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුරකට ලකුණු 2 බැගින් මුළු ලකුණු 40 කි.
- පහත සඳහන් ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඒ යටින් ඉරක් අඳින්න.

(01) ගුරු බස සැබෑ ම     ය
එය පිළිගැනුම යුතු ම     ය
පඬි බසත් එය ම     ය
එයින් දෙලොවෙහි මහත් සැප ම     ය

මෙම කවිය සඳහන් ග්‍රන්ථය කුමක් ද?

(1) සිරිත් මල්දම     (2) ලෝවැඩසඟරාව
(3) ගුත්තිල කාව්‍යය     (4) සුභාෂිතය

(02) ''ඒහිපස්සික''යනු ධර්ම රත්නයේ ගුණයකි. මෙයින් අදහස් වන්නේ,

(1) බුදුරජාණන් වහන්සේගේ ධර්මය මුල මැද අග යන තුන් තැන්හි ම යහපත් වන බවයි
(2) ඕනෑම අයකුට මේ ධර්මය පිළිබඳව විමසා බැලිය හැකි බවයි
(3) වෙනත් කටයුතු සියල්ල පසෙකින් තබා සිතට නගා ගැනීමට ධර්මය සුදුසු බවයි
(4) ධර්මය පිළිපැදීමෙන් ප්‍රතිඵල මේ ආත්මභාවයේම ලද හැකි බවයි

(03) බුදුරජාණන් වහන්සේ සුන්දර නිවන් මග ගමන් කොට සුන්දර වූ නිර්වාණයට පැමිණියහ මෙම අදහස ඇතුලත් බුදු ගුණය වන්නේ

(1) අරහං බුදු ගුණයයි.     (2) සම්මා සම්බුද්ධ බුදු ගුණයයි.
(3) විජ්ජාචරණ සම්පන්න බුදු ගුණයයි.     (4) සුගත බුදු ගුණයයි.

(04) බුදුරජාණන් වහන්සේ රජගහනුවර සූකරඛත ලෙනේදී දීඝනඛ නම් පිරිවැජියාට දේශනා කළ වේදනා පරිග්ගහ සූත්‍රය අසා රහත් භාවයට පත්වූයේ,

(1) මුගලන් තෙරුන් වහන්සේ ය.     (2) සැරියුත් තෙරුන් වහන්සේ ය.
(3) මහා කාශ්‍යප තෙරුන් වහන්සේ ය.     (4) සම්මුඤ්ජනී තෙරුන් වහන්සේ ය.

(05) බෞද්ධයාගේ අත්පොත ලෙස හැඳින්වෙන ධම්ම පදය අයත් වන්නේ

(1) දීඝ නිකායට ය.     (2) සංයුක්ත නිකායට ය.
(3) ඛුද්දක නිකායට ය.     (4) අංගුත්තර නිකායට ය.

(06) බෝසතාණන් වහන්සේගේ ප්‍රඥා මහිමය වඩාත් ප්‍රකට වන ජාතක කථාව මින් කුමක් ද?
- (1) සේරිවාණිජ ජාතකය
- (2) උම්මග්ග ජාතකය
- (3) නලපාන ජාතකය
- (4) තිල මුට්ඨි ජාතකය

(07) භික්ෂූන් වහන්සේලාගේ ප්‍රසාද ජනක පැවැත්ම උදෙසා බුදුරජාණන් වහන්සේ දේශනා කළ ඉතා උසස් ආචාර ධර්ම පද්ධතිය හඳුන්වනු ලබන්නේ,
- (1) බෝධිපාක්ෂික ධර්ම නමිනි.
- (2) අත්තුපනායික ධර්ම නමිනි.
- (3) සේඛියා ධර්ම නමිනි.
- (4) අසංඛත ධර්ම නමිනි.

(08) 'ජාත රූප රජත පටිග්ගහණා වේරමණී සික්ඛා පදං සමාදියාමි' යන සිල් පදය ඇතුළත් වන්නේ,
- (1) පංච සීලයෙහි ය.
- (2) ආජීව අෂ්ටමක සීලයෙහි ය.
- (3) අෂ්ටාංග උපෝසථ සීලයෙහි ය.
- (4) ගිහි දස සීලයෙහි ය.

(09) 'උත්සාහය සහ උනන්දුව මත ක්‍රියාකිරීමෙන් ඔබටද ධනවතකු විය හැකිය' මෙම ආදර්ශය ලබාදෙන ජාතක කතාවක් වනුයේ,
- (1) සේරිවාණිජ ජාතකයයි.
- (2) වණ්ණුපථ ජාතකයයි.
- (3) අපණ්ණක ජාතකයයි.
- (4) චුල්ලසෙට්ඨි ජාතකයයි.

(10) මහා මංගල සූත්‍රයේ සඳහන් මංගල කරුණක් නොවන්නේ,
- (1) ඥාතීන්ට සංග්‍රහ කිරීමයි.
- (2) මව්පියන්ට සැළකීමයි.
- (3) සේවකයින්ට යුතුකම් ඉටුකිරීමයි.
- (4) ගරු කළ යුත්තන්ට ගරු කිරීමයි.

(11) මානවකය, සත්වයෝ කර්මය ස්වකීය කොට ඇත්තාහ කර්මය දායාද කොට ඇත්තාහ කර්මය කාරණය කොට ඇත්තාහ කර්මය බන්ධු කොට ඇත්තාහ කර්මය පිළිසරණ කොට ඇත්තාහ. යනුවෙන් බුදුරජාණන් වහන්සේ වදාළේ,
- (1) ඡත්ත මානවකයාට ය.
- (2) සුභ මානවකයාට ය.
- (3) මඝ මානවකයාට ය.
- (4) සිගාලක මානවකයාට ය.

(12) දළදා වහන්සේ පිළිබඳව ලියැවුණු ඉපැරැණිම ග්‍රන්ථය වනුයේ
- (1) දාඨාවංශයයි.
- (2) මහාවංසයයි.
- (3) දීපවංසයයයි.
- (4) ථූපවංසයයයි.

(13) ලෝක පාලක ධර්ම යනු,
- (1) කුසල් හා අකුසල් ය.
- (2) යස හා අයස ය.
- (3) සැප හා දුක්ඛ ය.
- (4) හිරි හා ඔත්තප්ප ය.

(14) අන් අයගේ සැපත දැක සතුටට පත්වන උදාර ගුණය හඳුන්වන්නේ,
- (1) මෙත්තා ගුණය නමිනි
- (2) කරුණා ගුණය නමිනි
- (3) මුදිතා ගුණය නමිනි
- (4) උපේක්ෂා ගුණය නමිනි

(15) රුක් රෝපණ ක්‍රියාවලියට අදාල **නොවන** ප්‍රකාශය මින් කුමක් ද?

(1) ජල මූලාශ්‍ර සිඳී නොයාම (2) පරිසරය අලංකාර වීම.

(3) පසෙහි සාරවත් බව සුරක්ෂිත වීම. (4) වර්ෂාව හීන වීම.

(16) ලෝකයේ පුද්ගලයෝ සතර ආකාර වෙති. බුදු දහමට අනුව වඩාත් ම ඇගයීමට ලක් කරනුයේ මින් කවර පුද්ගලයන්ද?

(1) තම සැපත යහපත ගැන පමණක් සිතා කටයුතු කරන පුද්ගලයින් ය.

(2) අනුන්ගේ සැපත යහපත ගැන පමණක් සිතා කටයුතු කරන පුද්ගලයින් ය.

(3) දෙපක්ෂයේම සැපත යහපත ගැන සිතා කටයුතු නොකරන පුද්ගලයින් ය.

(4) දෙපක්ෂයේම සැපත යහපත ගැන සිතා කටයුතු කරන පුද්ගලයින් ය.

(17) යමෙකු විසින් කරන ලද පාප කර්මය ඔහු විසින්ම කරන ලද කුසල කර්මයෙන් වැසී යයි ද ඒ තැනැත්තා වලාකුළින් නිකුත් වූ සඳ මෙන් මේ ලෝකය බබළවයි.
මේ අර්ථය ඇති ''යස්ස පාපං කතං සම්මං............'' යන ධම්මපද ගාථාව දේශනා කළේ,

(1) දෙව්දත් තෙරුන් උදෙසා ය.

(2) අංගුලිමාල තෙරුන් උදෙසා ය.

(3) ඡත්ත මානවකයා උදෙසා ය.

(4)) මට්ටකුණ්ඩලී උදෙසා ය.

(18) බුදු දහමෙහි ඉගැන්වෙන සතරාකාර වූ මරණ අතුරින් ආයුෂත්, කර්ම ශක්තියත් යන දෙක ම ඉතිරිව තිබිය දී හදිසි අනතුරු, ලෙඩ රෝග වැනි උපද්‍රවයන් නිසා සිදුවන මරණය හඳුන්වනුයේ,

(1) ආයුක්ඛය ලෙස ය. (2) කම්මක්ඛය ලෙස ය.

(3) උභයක්ඛය ලෙස ය. (4) උපච්ඡේදක ලෙස ය.

(19) සිගාලෝවාද සූත්‍රයේදී ස්වාමි පුරුෂයා විසින් භාර්යාව උදෙසා ඉටුකළ යුතු යුතුකම් පහකි. එයින් හතරක් මෙහි දක්වා ඇත. එනම් සම්මාන කිරීම, අවමන් නොකිරීම, වෙනත් කාන්තාවන් කරා නො යාම, වගකීම් පවරා දීම යනුවෙනි. ඊළඟ යුතුකම වන්නේ,

(1) නිවාස ලබාදීමයි.

(2) ඇඳුම් පැළඳුම් ලබාදීමයි.

(3) නිවසට අවශ්‍ය දේවල් ලබා දීමයි.

(4) බිරිඳ හා දරුවන් සමඟ ගමන් බිමන් යාමයි.

(20) බුදු දහමට අනුව මිථ්‍යා දෘෂ්ටිය යනු,

(1) වැරදි ලෙස කම්සැප විඳීම ය.

(2) ලෝකය හා සත්ත්වයා පිළිබඳව වැරදි වැටහීම ය.

(3) වැරදි ජීවනෝපායන් ය.

(4) සිතින්, කයින්, වචනයෙන් වැරදි සිදු කිරීම යි.

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.**

(01) ඔබ පන්තියේ බුද්ධ ධර්මය විෂයට අදාළව තෙවන වාරයේ සිදුකළ ''ශිෂ්‍ය පාර්ලිමේන්තුව'' ඇගයීම ආශ්‍රිතව පහත ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.

(1) මෙම ඇගයීම සඳහා ඔබට ලැබුණු ගුරු උපදෙස් දෙකක් ලියන්න.
(2) ළමා පාර්ලිමේන්තුව පිහිටුවීමට පෙර සිදුකළ කාර්යයන් දෙකක් ලියන්න.
(3) ඔබ පන්තියේ පිහිටුවාගත් පාර්ලිමේන්තුවේ මන්ත්‍රී ධූර ගණන කීයද?
(4) පාර්ලිමේන්තුවේ ප්‍රධානියා කවර නමකින් හැඳින් වේ ද?
(5) පාර්ලිමේන්තුවේ විවාදයට පාත්‍ර වූ අමාත්‍යාංශ දෙකක් නම් කරන්න.
(6) වජ්ජීන් සමග සටනට සූදානම් වූයේ කවුද?
(7) වජ්ජීන් අනුගමනය කළ පාලන ක්‍රමවේදය කුමක්ද?
(8) එම පාලන ක්‍රමවේදයේ කරුණු දෙකක් නම් කරන්න.
(9) සමූහාණ්ඩු පාලනය යනු කුමක්ද?
(10) මෙම ඇගයීම තුළින් ඔබ ලැබූ අත්දැකීම් දෙකක් ලියන්න.

(මුළු ලකුණු 2x10 = 20)

(02) (1) මහා මංගල සූත්‍රය දේශනා කළේ කාටද? කොහිදී ද? (ලකුණු 02)
(2) බුදුරජාණන්වහන්සේ මහා මංගල සූත්‍රය දේශනා කිරීමට පෙර පැවති මංගල සම්මත විශ්වාසයන් තුන නම් කරන්න. (ලකුණු 03)
(3) අසේවනාච බාලානං - පණ්ඩිතානංච සේවනා
පූජාච පූජනීයානං - ඒතං මංගල මුත්තමං
යන ගාථාවේ අදහස ලියන්න. (ලකුණු 05)

(03) (1) ගිහියන් විසින් උපදවාගත යුතු සැප හතරක් පිළිබඳව අනණ සූත්‍රයෙහි සඳහන් වේ. ඉන් දෙකක් ලියන්න. (ලකුණු 02)
(2) ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 03)
(3) බුදුරජාණන් වහන්සේ ප්‍රතික්ෂේප කර ඇති වෙළදාම් 5 නම් කර ඉන් සමාජයට වන අයහපත කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(04) (1) ශ්‍රී දළඳා වහන්සේ ලක්දිවට වැඩම කළේ කවුරුන් විසින් ද? (ලකුණු 02)
(2) රන්දෝලි ඇසළ මහා පෙරහැර ප්‍රධාන පෙරහැරවල් පහකින් සමන්විත වේ ඉන් තුනක් නම් කරන්න. (ලකුණු 03)
(3) බෞද්ධයන් ලෙස අපට ශ්‍රී දළදා වහන්සේගේ වටිනාකම පැහැදිලි කරන්න. (ලකුණු 05)

(05) (1) ප්‍රථම සංගායනාව පැවැත්වූ ස්ථානය සහ මූලිකත්වය ගත් මහ රහතන් වහන්සේ නම් කරන්න. (ලකුණු 02)
(2) ප්‍රථම සංගායනාව පැවැත්වීමට හේතු වූ ප්‍රධාන කරුණ පැහැදිලි කරන්න. (ලකුණු 03)
(3) බුදු සසුන රැකගැනීම සඳහා ප්‍රථම සංගායනාවෙන් ඉටුවූ සේවය පැහැදිලි කරන්න. (ලකුණු 05)

(06) (1) බුදුසිරිතෙහි අසිරිමත් සිදුවීම් රැසක් ස්වභාවික පරිසරය හා බැඳී පවතී.
එවැනි සිදුවීම් දෙකක් ලියා දක්වන්න. (ලකුණු 02)

(2) ආහාර අනුභවයේ දී අනුගමනය කළ යුතු යහපත් පුරුදු තුනක් ලියන්න. (ලකුණු 03)

(3) වර්තමානයේ පරිසරය සුරැකීමට දායකවීම ශිෂ්‍ය අපගේද පරම යුතුකමකි.
ඒ සඳහා ඔබ විසින් කරනු ලබන යෝජනා කිහිපයක් හඳුන්වා දෙන්න. (ලකුණු 05)

(07) (1) බුදු දහමට අනුව කර්මය හෙවත් ක්‍රියා සිදුවන ප්‍රධාන දොරටු තුනකි. ඒවා නම් කරන්න. (ලකුණු 02)

(2) යම්කිසි ක්‍රියාවක් කුසල් හෝ අකුසල් ලෙස සැලකීමේදී ප්‍රතිඵල අනුව ප්‍රධාන මිනුම් ක්‍රම තුනකට භාජනය කෙරේ. එම ක්‍රම තුන නම් කරන්න. (ලකුණු 03)

(3) නිරතුරුවම කුසල් රැස් කරන තැනැත්තාට මෙලොව පරලොව සුවසේ සිටිය හැකිය. මෙය නිදසුන් මඟින් පෙන්වා දෙන්න. (ලකුණු 05)